**"ප්‍රතිඵල පාදක මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම - ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ තොරතුරු අත්පොත" කෙටුම්පත සංශෝධනය කිරීම.**

ප්‍රතිඵල පාදක මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කාර්යය සඳහා මූලික පියවර ලෙස පළාතේ සියළුම ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් තොරතුරු රැස් කිරීම සඳහා සකස් කරන ලද "ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ තොරතුරු අත්පොත" කෙටුම්පත පළාතේ දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාළ කොට්ඨාශයන්හි රාජකාරී කරනු ලබන සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් හමුවේ ඉදිරිපත් කොට එහි සිදු කළ යුතු සංශෝධනයන් සහ වැඩිදියුණු කිරීම් සඳහා අදහස්, යෝජනා ලබා ගැනීම මෙම අදියරේදී සිදු කරන ලදී.

ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තුලාන් මට්ටමින් සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගෙන් යුත් කණ්ඩායමක් රැස් කොට වැඩමුළුව පවත්වන ලදී.

එහිදී ලබා ගත් අදහස්, උපදෙස්, යෝජනා ඇතුළු සියළු සංශෝධනයන් පාදක කරගනිමින් සකස් කරන ලද " ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ තොරතුරු අත්පොත" අදාළ කොට්ඨාශයන්හි රාජකාරී කරනු ලබන සියළු ක්ෂේත්‍ර නිලධාරීන් එක් වී **2018** වර්ෂයේදී සම්පූර්ණ කළ යුතු අතර, ඉන් ලබා ගන්නා තොරතුරු පදනම් කොට ගෙන **2018** වර්ෂයේදී ප්‍රතිඵල පාදක මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම සකස් කොට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

වැඩසටහන් පැවැත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ:

| අනු අංකය | දිනය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|
| 1 | 2017.12.12 | මිහින්තලේ |
| 2 | 2017.12.14 | තිරප්පනේ |
| 3 | 2017.12.15 | නොච්චියාගම |
| 4 | 2017.12.18 | පලාගල |
| 5 | 2017.12.20 | තඹුත්තේගම |
| 6 | 2017.12.20 | නැ.නු.ප. |
| 7 | 2017.12.20 | වැලිකන්ද |
| 8 | 2017.12.21 | තලාව |
| 9 | 2017.12.21 | ගල්නෑව |
| 10 | 2017.12.22 | රඹෑව |
| 11 | 2017.12.22 | විලච්චිය |
| 12 | 2017.12.23 | පලුගස්වැව |
| 13 | 2017.12.26 | මැදවච්චිය |
| 14 | 2017.12.26 | කැබිතිගොල්ලෑව |
| 15 | 2017.12.26 | හොරොව්පොතාන |
| 16 | 2017.12.27 | කහටගස්දිගිලිය |
| 17 | 2017.12.27 | ඇලහැර |
| 18 | 2017.12.27 | ගලෙන්බිඳුණුවැව |
| 19 | 2017.12.27 | දිඹුලාගල |
| 20 | 2017.12.28 | ම.නු.ප. |
| 21 | 2017.12.28 | ලංකාපුර |
| 22 | 2017.12.28 | ඉපලෝගම |
| 23 | 2017.12.28 | හිඟුරක්ගොඩ |
| 24 | 2017.12.29 | මැදිරිගිරිය |
| 25 | 2017.12.29 | කැකිරාව |
| 26 | 2017.12.29 | රාජාංගනය |
| 27 | 2017.12.29 | තමන්කඩුව |